STERLING™


STEELS

ලොවම පිළිගත් සෙවිලි විසඳුම



# ස්ටර්ලින් ස්ටීල්ස්


# ප්‍රවාහනය, සවි කිරීමේ සහ ඇසිරීමේ නිවැරදි මඟ





# තහඩු ප්‍රවාහනය කිරීමේදී අනුගමනය කළ යුතු දෑ

- ඇණවුම් පතෙහි ඇති භාණ්ඩ වල දිග, පළල හා බරට සරිලන වාහනයක් භාවිතා කරන්න.
- රූෆින් ෂීට්, පර්ලින් සහ අනෙකුත් උපාංග පැටවීමේදී සීරීම් සහ හානි වළක්වා ගැනීමට කඩදාසි භාවිතා කර හොඳින් වෙන් කර ගන්න.
- රූෆින් ෂීට් මත අධික බර පැටවීමෙන් වළකින්න.
- ටයිල් රූෆින් රැගෙන යාමේදී විශේෂ අවධානයක් යොමු කරන්න. ඒ මත ඇවිදීම, අධික බර, ලී කොට හෝ වෙනත් යමක් තැබීමෙන් වළකින්න.
- වැහි පීලි හෝ අනෙකුත් උපාංග ප්‍රවාහනයේදී තදින් ගැට ගසා හොඳින් ආවරණය කර ගන්න.
- පැටවීම් අවසානයේ ප්‍රවාහනයට පෙර භාණ්ඩ හොඳින් ගැට ගසා ගන්න.
- පර්ලින් සමග රූෆින් ෂීට් තබා ගෙන යාමේදී වඩාත් සැලකිලිමත් වන්න.




# තහඩු ගබඩා කිරීමේදී / ඇසිරීමේදී අනුගමනය කළ යුතු දෑ



අභ්‍යන්තර ගබඩාකරණය

ආවරණය කරන ලද ස්ථානයක ගබඩා කර තබන්න. එළිමහනේ ගබඩා කර තබන්නේ නම් ජල ප්‍රතිරෝධී ආවරණයකින් වසා තබන්න.




ආවරණයකින් ආවරණය කිරීම

තහඩු ඉක්මනින්ම භාවිතයට අපේක්ෂා නොකරන විට තහඩු ගබඩා කිරීමට ප්‍රථම බිම මතුපිට පිරිසිදු කර පොළව හා (Sheet) තහඩු අතර පරතරය 30 cm වන ආකාරයට පිළිවෙලින් තහඩු ගොඩ ගසන්න.



ආනතික ගබඩාකිරීම

තහඩු අසුරා තැබීමේදී අවම වශයෙන් 50° බෑවුමක් සිටින සේ අසුරා තබන්න. එමගින් ජලය තහඩු ආවරණය මත රැඳීමක් සිදු නොවේ.




ක්‍රමවත් පරීක්ෂාව

තහඩු ගබඩා කර ඇති ස්ථානය නිතරම පරීක්ෂා කර බලන්න.




තහඩු තෙමී ඇත්නම් හැකි ඉක්මනින් තහඩු වෙන් කර සිනිඳු රෙදි කැබැල්ලකින් පිස දමා හානි නොවන ලෙස නැවත අසුරා තබන්න.



පුද්ගල ආරක්ෂිත උපකරණ (අත්වැසුම් හා පාවහන්) භාවිතා කරන්න.

# තහඩු අසුරා තැබීමේදී සිදු නොකළ යුතු දෑ

- ඇසුරූ තහඩු මත බර උපකරණ නොතබන්න. එමගින් තහඩු හානි වීමට ලක් විය හැක.
- සුදුසු ආධාරකයක් නොමැති නම් තහඩු සිරස්ව ඇසිරීමක් සිදු නොකරන්න.




- තහඩු පස් සමග සම්බන්ධ වන ලෙස නොතබන්න.




- තහඩු ඔසවා යාමට යකඩ දම්වැල් භාවිතා නොකරන්න.



- තහඩු එක මත එක හෝ ඇදගෙන යාමක් සිදු නොකරන්න.




# සවි කිරීමේදී අනුගමනය කළ යුතු දෑ



- තහඩු සවි කිරීමේදී නිර්දේශිත පුද්ගල ආරක්ෂණ ආවරණ පළඳින්න. (හිස් හා අත් ආවරණ, පාවහන්, අත් වැසුම් හා අනපේක්ෂිත අවදානම් අවම කිරීමට සකසා ඇති උඩුකය ආවරණ).

- සෑම විටම සුවපහසු, මෘදු අඩි සහිත පාවහන් පළඳින්න.




- තහඩු, සමතලා පෘෂ්ඨයක් මත තබා කැපිය යුතුය. වෙනත් ද්‍රව්‍යයන් මත තබා කැපීමේදී එක්විය හැකි මුවහත් අපද්‍රව්‍ය කැබලි තහඩු වලට හානිදායක විය හැක.

  වානේ අබලි ද්‍රව්‍ය, ඩ්‍රිල් අපද්‍රව්‍ය, පොප් රිවට් සහ අමතර ඇණ වැනි සියලුම ද්‍රව්‍යයන් තහඩු මතින් ඉවත් කරන්න. මෙමගින් මළබැඳීම වැළකේ.



- අඩු ඝනකමින් යුත් වානේ කැපීමට යොදා ගන්නා නියමිත තහඩු කපන කතුරක් භාවිතා කරන්න.





- සෑම විටම ඉස්කුරුප්පු ඇණ රූෆින් ෂීට්ස් ඉස්සු දාරයන්හි (Rib) තබා සවි කරන්න. බිත්ති ආවරණයන්හි (Rib) හෝ පහත් මතුපිටක (Valley) තබා ඇණ සවි කළ හැකිය.

- නිර්දේශිත EPDM රබර් මුද්‍රා වොෂර් සහිත ඉස්කුරුප්පු ඇණ පමණක් භාවිතා කරන්න.

# සවි කිරීමේදී අනුගමනය කළ යුතු දෑ

✓ රූෆින් ෂීට්ස් දෙකක් සවි කිරීමේදී ඒ සඳහා නියමිත කොටස (Groove) ඇතුළට සිටින ලෙස සවි කළ යුතුයි. එමගින් නිර්මාණය මත වායු ප්‍රතිරෝධකය වැසි ජලය කාන්දු වීම වළකයි.



✓ ටියුබ්, HSS, ඇන්ගල්ස්, චැනල්ස් (සින්ක් ආලේපිත ආධාරක හැර) රූෆින් ෂීට්ස් වලට සවි කිරීමට පෙර තීන්ත ආලේප කර යොදා ගත යුතුය.

✓ නියුට්‍රල් කියෝ සිලිකන් රබර් සීලන්ට් පමණක් භාවිතා කළ යුතුය.



✓ මෝක් හා මාකර් පෑන්වලින් සලකුණු කළ පසු ආධාරකයන්ට කෙලින්ම ඇණ සවි කරන්න.



✓ පිරිසිදු ජලය හෝ මෘදු සේදුම් කාරකයන් යොදා සවි කිරීම අවසානයේ වහල පිරිසිදු කරන්න. ඒ සඳහා මෘදු රෙදි කැබැල්ලක්, මොප් හෝ නයිලෝන් කෙදි සහිත බුරුසුවක් යොදා ගන්න.

✓ රූෆින් ෂීට්ස් සවි කිරීමේදී ඔබගේ ශරීර බර සමානව පාවහන් දෙකටම යෙදෙන අයුරින් (Valley) කොටස තුළ පමණක් වහල මත ගමන් කරන්න.



# සවි කිරීමේදී නොකළ යුතු දෑ

- වර්ණ ආලේපිත රූෆින්, සිමෙන්ති, අපද්‍රව්‍ය, තීන්ත සහ තිනර් වැනි රසායනික ද්‍රව්‍ය සමග නොතබන්න.




- වර්ෂාව ඇති විටදී රූෆින් ෂීට්ස් ලිස්සන සුළු බැවින් සවි නොකරන්න.



- සුදු යකඩ වලින් සාදා ඇති ඉස්කුරුප්පු ඇණ, J හුක් සහ කාබන් වොෂර් රූෆින් ෂීට්ස් වලට හානිදායක බැවින් පාවිච්චි නොකරන්න.




- ප්‍රමාණයට වඩා වැඩියෙන් සහ අඩුවෙන් ඇණ තද කිරීමෙන් වළකින්න. එය ජල කාන්දු වීම් සහ වොෂර් හානි වීමට හේතු වේ.



# සවි කිරීමේදී නොකළ යුතු දෑ

× රූෆින් ෂීට්ස් දෙකක් සවි කිරීමේදී ඒ සඳහා නියමිත කොටස (Groove) පිටතට සිටින ලෙස සවි නොකළ යුතුයි. එමගින් වැසි ජලය කාන්දු වීමට ඉඩ සලසයි.





× වානේ ආයුධ හා උපාංග වහල මත නොතබන්න.

× කුරුල්ලන් සඳහා ආහාර වහල මත නොතබන්න. කුරුළු අපද්‍රව්‍ය රූෆින් ෂීට්ස්හි වර්ණයට සහ නිමාවට හානි කළ හැක.



× ඇසිටික් අම්ලය අඩංගු සීලන්ට් භාවිතා නොකරන්න. සාන්ද්‍රණය වැඩි සහ සොල්වන්ට් වර්ගයේ පිරිසිදු කාරක සහ යකඩ බුරුසු, වානේ කෙඳි, ස්පොන්ජ් වැනි ද්‍රව්‍ය පිරිසිදු කිරීමට භාවිතා නොකරන්න. එමගින් තීන්ත ආලේපිතය ඉවත් වනු ඇත.





× රූෆින් ෂීට්ස්හි තනි ඉස්සූ දාරයක් මත (Rib), වැනි පීලි අසල වූ ආධාරක නොමැති ස්ථාන මත සහ ස්කයිලයිට් ෂීට්ස් මත පය නොතබන්න.



# නිර්දේශිත / ප්‍රමිත මුදුන් ආවරණ සහ ඇණ

## මුදුන් ආවරණය (Ridge Cap)

ඔබ භාවිතා කරන සෙවිලි තහඩු වල වර්ණයන්ට සමාන වර්ණයන්ගෙන්ම මුදුන් ආවරණ ලබා ගත හැකිය. මුදුන් ආවරණයේ දෙපසට නැමී ඇති කොටස සෙවිලි තහඩුවේ ඉහළට නෙරා ඇති කොටසට සමමිතික (Fit) වන සේ කපා දමන්න. එය දූවිලි වලට සහ කෘමීන් සඳහා ප්‍රතිරෝධී ආවරණයක් ලෙස ක්‍රියා කරනු ලබයි.






## ඇණ

නිර්දේශිත ඇණ වර්ග පමණක් භාවිතා කරන්න. අඩු ගුණත්වයෙන් යුත් ඇණ වර්ග භාවිතය නිසා දිගු කාලීනව මළබැඳීමට භාජනය වීම තුලින් ඔබගේ වර්ණ ආලේපිත සින්ක් ඇලුම් තහඩුවට හානි වීමේ අවදානමක් ඇත.





STERLING STEELS


## STERLING STEELS LIMITED

No. 26 & 27, Sapugaskanda Industrial Estate
Pattiwila Road, Sapugaskanda, Sri Lanka.
Telephone : +94 11 2400611
Fax: +94 11 2400618

Hotline +94 777 270 470